## එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 07 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මාර්තු 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 . මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ). ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ආ ). සමාලෝචිත වර්ෂය අවසානයට අතැති ගබඩා තොග භෞතිකව හර වැරදි බැලූ අගයට නොව පොත් අගයට දක්වා තිබුණි .

( ඇ ). 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ඇ ). සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු භාණ්ඩ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි .

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.103,268 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,105,109 ක් විය .

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| ( i ) . වරිපනම් සහ බදු | - | - | - |
| ( ii ) . කල්බදු කුලී | 3,721 | 3,090 | 5,637 |
| ( iii ) . බලපත්‍ර ගාස්තු | 1,000 | 999 | 135 |
| ( iv ) . වෙනත් ආදායම් | 1,861 | 1,861 | - |

2.2.2. උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන් ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ප්‍රමාණය රු.9,627,158 ක් විය.

2.3. අවිධිමත් ගනුදෙනු

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ අංක 1769 සහ 1992 සැප්තැම්බර් 08 දිනැති චක්‍රලේඛයට පටහැනිව, ගොඩනැගිලි සැලසුම් ඇදීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට රු.193,399 ක මුදලක් ගෙවා තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ). ආදායම් රැස් කිරීම.
( ආ ). අත්තිකාරම්.
( ඇ ). ගිණුම්වාර්තා.